VIDUS 20-1-11

# ශිෂ්‍ය ව්‍යාපෘතියක තිබිය යුතු මූලික ලක්ෂණ

ආචාර්ය ජයන්ති පී. එදිරිසිංහ
සත්ත්ව විද්‍යා අධ්‍යනාංශය
*පේරාදෙණිය විශ්ව විද්‍යාලය*

ශිෂ්‍ය ව්‍යාපෘති කරනු ලබන්නේ විභාගවල අවශ්‍යතාවන් සම්පූර්ණ කිරීමටත්, විශේෂ නිර්දේශයට අයත්වූ කොටසක් වශයෙන් මෙන්ම ගුරුවරයා විසින් දෙනු ලබන අගැයීමක් ද වශයෙනි. අවශ්‍යතාව කුමක් වුවත් ශිෂ්‍ය ව්‍යාපෘතියකින් එක්තරා නිර්නායක කීපයක් සපුරාලිය යුතුය. යම් අයෙක් සිය ව්‍යාපෘතියට නැඹුරුවීමට පෙර මෙම නිර්නායක පිළිබඳ පැහැදිලි අවබෝධයක් ඔහු හෝ ඇය ලබා තිබීම ඉතා වැදගත්ය. බොහෝ ශිෂ්‍ය ව්‍යාපෘති වර්ග පෙන්නුම් කරන වැදගත් ලක්ෂණ පහත සඳහන් කර ඇත.

1 ව්‍යාපෘතියක් කරනු ලබන්නේ ක්‍රියාදාමයක (ක්‍රියාවලි) සිද්ධියක, ස්ථානයක, වටපිටාව ගැන පුද්ගලයෙකු හෝ පුද්ගල කණ්ඩායමක් ( සතුන්, ශාක සහ පුද්ගලයින්) යනාදිය පිළිබඳ තොරතුරු සොයා එක්රැස් කිරීමටයි. මෙය ව්‍යාපෘතියක අරමුණ(ණු) සපුරාලයි. ව්‍යාපෘතියක **මාතෘකාව (Title)** පුළුල් අරමුණක් පදනම් කරගෙන තිබිය යුතු අතර එය නියමිත ව්‍යාපෘතිය කුමක්ද යන්න පිළිබඳ පූර්ණ අදහසක් විද්‍යාමාන වන ලෙස ලියවී තිබිය යුතුය.

2 ඔබ යම් ව්‍යාපෘතියක් ගැන තීරණය කරගෙන ඇති විට, එම ව්‍යාපෘතියේ අවසානය ප්‍රතිඵලය කුමක්ද යන්න පිළිබඳව 'අනුමාන කළ පූර්ව අදහසක් (preconceived idea) ඇති කරගෙන තිබීමට පුළුවන. මෙවැනි අනුමාන කළ පූර්ව අදහස් ලැබෙන්නේ පොත්පත් කියවීමෙන්, පුද්ගලයන් සමග සාකච්ඡා කිරීමෙන් හෝ බුද්ධිමය අනුමාන කිරීම් මගිනි. මෙමගින් අදාළ විෂය පිළිබඳ කවර ආකාරයේ තොරතුරු තිබේ දැයි සොයා දැන ගැනීමට හැකිවේ. මෙම කරුණු ව්‍යාපෘතියක **'හැඳින්වීම' (Intro duction)** මගින් අවධාරණය කෙරේ. හැඳින්වීම තුළ ඔබ කරන්න බලාපොරොත්තු වන දේ වැදගත්කම හේතු දක්වමින් සාධාරණය කළ යුතුය.

3 ආරම්භයේදීම, ව්‍යාපෘතිය කිරීමෙන් කවර ආකාරයේ විශේෂිත තොරතුරු සොයා ගැනීමට හැකිවේ ද යන්න පිළිබඳව සම්පූර්ණ පැහැදිලි පසුබිමක් ව්‍යාපෘතිය කරන්නා සතුව තිබිය යුතුය. මෙය ව්‍යාපෘතියේ **අභිමතාර්ථ**(ය)වේ. අභිමතාර්ථ සරලවීම සහ තිබෙන සම්පත් මගින් නිශ්චිත කාලය තුළ අභිමතාර්ථ ලඟාකර ගතහැකි වීම සැලකිල්ලට ගනු ලැබේ. අභිමතාර්ථ(ය) දැනගත් විට මෙම අභිමතාර්ථ (ප්‍රශ්න සඳහා පිළිතුරු සෙවීම) සපුරාලීමට තොරතුරු සොයාගත හැක්කේ කෙසේදැයි සොයා බලා සකසා ගත යුතුය. මෙය ව්‍යාපෘතියක **ක්‍රම(ය) (Method(s)** යනුවෙන් හැඳින්වෙයි.

4 ඔබ අනුගමනය කිරීමට බලාපොරොත්තු වන ක්‍රියා පටිපාටිය එහි පියවර ලැයිස්තුවයි. වැඩකිරීම සඳහා අවශ්‍ය සම්පත් එම ව්‍යාපෘතියට අවශ්‍ය ද්‍රව්‍යයන් වේ. එහෙයින් **ද්‍රව්‍ය සහ ක්‍රම( Materials and Methods )** යන කොටස් තෝරා ගැනීම අවශ්‍යයි. මේ වනවිට අභිමතාර්ථ ලඟාකර ගැනීමට කුමන ආකාරයේ ද්‍රව්‍ය ව්‍යාපෘතිය කිරීමට අවශ්‍ය වේද එසේම එය කෙසේ පවත්වාගෙන යායුතු ද යන්න පිළිබඳ ඔබට වැටහීමක් ඇත. තවද ක්‍රම වේදයට සතුන්, ශාක සහ මිනිසුන් ඇතුලත් වෙයි නම් ක්‍රමය සාරධර්මානුකූල, සමාජීය වශයෙන් පිළිගත හැකි මෙන්ම පරිසර හිතැති සහ රටේ නීතිය තුළ ක්‍රියාත්මක වන බවට සහතික විය යුතුයි.

5 බොහෝවිට කරගෙන යාමට අවශ්‍ය කාර්යය පහත ආකාරයේ එකක් වේ. (a) තොරතුරු එක්රැස් කිරීම, (b) ව්‍යාප්තිය අධ්‍යයනය, (c) සංඛ්‍යා, ගණන් කිරීම, (d) කාලය/ප්‍රමාණය (උස)/ ඉඩ ප්‍රමාණය (දිග සහ පළල) යනාදියෙන් එකක් පිළිබඳ මිණුම් ගැනීම්, (e) තේරීම්, ශ්‍රේණිගත කිරීම් හෝ කාණ්ඩගත කිරීම් ( මුලින් තීරණය කරගත් කණ්ඩායම් වලට දැමීම ) නැත්නම් ක්‍රමානුකූලව

නිරීක්ෂණ සටහන් කර ගැනීමයි. මෙම ක්‍රියාකාර කම **දත්ත (Data)** එක්රැස් කිරීම වේ. එක්රැස් කරන ලද දත්ත යම් පිළිවෙලකට පොතකට (Data Book) ඇතුලත් කළ යුතු අතර එය කඩදසි තීරුවල නොවිය යුතුයි. දත්ත හැකි තරම් නිවැරදිව හරියාකාරව එක්රැස්කර ගත යුතුය. එමනිසා අවශ්‍ය සියළුම විස්තර ව්‍යාපෘතිය ආරම්භයට ප්‍රථම දෙමාපියන්, ගුරුවරුන් හා ජ්‍යෙෂ්ඨයින් ගෙන් ලබාගත හැකිය.

6 එක්රැස් කරගත් තොරතුරු වල දත්ත පහසුවෙන් අවබෝධ වන ආකාරයට ඉදිරිපත් කළ හැක. (i) තොරතුරු දක්වෙන සිතියම්. (charts) (ii) වගු (tables) (iii) කටු සටහන් ඇඳීම ( Drawing of sketches) (iv) ප්‍රස්ථාර (Graphs) (v) ස්ථම්භ ප්‍රස්ථාර (Histograms) යනාදියෙන් එකක් හෝ යොද ගැනීමට ව්‍යාපෘති වාර්තාවක හෝ ව්‍යාපෘති ඉදිරිපත් කිරීමක ඉතා වැදගත් අංගයකි.

7 එක්රැස් කරගත් දත්ත (තොරතුරු) ඔබේ අධ්‍යයනයේ **ප්‍රතිඵල වේ**. (Results)

8 ව්‍යාපෘතිය කිරීමෙන් ඔබ ලබාගත් ප්‍රථිපල (තොරතුරු). ව්‍යාපෘතිය ආරම්භයේදී ලැයිස්තුගත කර තිබූ අරමුණු කරා ලඟා වූයේද යන්න පිරික්සීම පිණිස සාකච්ජාවට භාජනය කිරීම අවශ්‍ය වේ. ඒ අනුව සාකච්ජාව (Discussion) ව්‍යාපෘතියක වැදගත් මෙන්ම සිත් ගන්නා සුළු කොටසයි. මෙම කොටස තොරතුරු සැපයීම මුල්කර ගෙන ව්‍යාපෘතියේ සියළුම කරුණු ඒකරාශි කරයි. එහිදී ව්‍යාපෘතිය කිරීමේදී ඇතිවන අඩුපාඩු හා ප්‍රශ්න සියල්ල සැලකිල්ලට ගැනේ. ඔබගේ සොයා ගැනීම් තුළින් ඔබ විසින් සඳහන් කිරීමට කැමති දියුණු කිරීම්, විචාරශීලී අනුමාන හා නිර්දේශයන් සාකච්ජාවේ ඉතා වැදගත් අංගයන් වේ.

9 අවසන් වශයෙන් වැදගත් **නිගමනයන්** (Conclusions) හෝ ව්‍යාපෘතියේ සොයා ගැනීම් කෙටියෙන් සඳහන් කරමින් අවසන් කළ යුතුයි.

10 ව්‍යාපෘතියේ අවසාන ප්‍රථිපලය වන්නේ **ව්‍යාපෘති වාර්තාව** ලිවීමයි. එම වාර්තාවේ තත්ත්වය මත ඔබ විසින් කරන ලද කාර්යය ඇගයීමකට සහ ලකුණු දීමකට භාජනය කරනු ලබයි. මෙහිදී නිවැරදි වචන වලට සහ ක්‍රියාවට (ක්‍රමවේදය අතීත කාලයෙන් ලිවීම අවශ්‍යය) වැඩි අවධානයක් දක්වමින් ප්‍රවේශමෙන් කළ යුතු අතර නිවැරදිව හා ක්‍රමාණුකූලව ඉදිරිපත් කළ යුතුය. වාර්තාව ලිවීම සඳහා විශේෂිත අනුපිළිවෙලක් නොමැති වුවත්, විශේෂිත තොරතුරු ව්‍යාපෘතියක ඇතුලත් කළ යුතුය. මෙම තොරතුරු **ආලේප කර** ඇති **උප මාතෘකා** ( bold subtitles) යටතේ මෙම ලිපියේ දක්වේ.

11 පොත් සහ අනෙක් වාර ප්‍රකාශන හෝ ලිපි මගින් තොරතුරු ලබා ගත්තේ නම් ඒවා සියල්ල සඳහන් කළ යුතුය. ආකාරාදි අනුපිළිවෙලට ලැයිස්තුගත කරගත් මේවායේ කර්තෘවරුන්ගේ වාසගම්වල තොරතුරු සියල්ල **විමර්ශනය** ( References ) වේ.

12 ඔබට විවිධාකාරයෙන් ව්‍යාපෘතිය සිදුකිරීම සඳහා උදව් කළ පුද්ගලයන්ට ස්තුතිය සඳහන් කිරීම "**ස්තුති කිරීම**" (Acknowledgement) යටතේ සිදුවේ.

13 ඉතා හොඳින් සැළසුම් කළ නිවැරදිව පවත්වාගෙන ගිය ව්‍යාපෘතිය හොඳට ලියා ඇතිවිට, එය ඔබට පමණක් නොව අන් අයටද ප්‍රයෝජනවත් ලියවිල්ලක් වේ.